# වී ගොවිතැනෙහි ලාභදායීතාවය හා සම්පත් භාවිතය

වීවල සහතික මිළ, වගා ණය ආධාර, පෝර හා බිත්තර වී රජය සපයා දීම යනාදී ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීමේ දී කුඹුරු ගොවිතැනෙහි සම්පත් භාවිතය, නිෂ්පාදන වියදම් හා ආදායම් මට්ටම් ආදීය පිළිබඳ තොරතුරු ඉතාම වැදගත්ය. මේ තත්වයන් කලින් කල වෙනස්වන සුළුය. එම වෙනස් වන තත්වයන් ගැන අවබෝධයකින් යුතුව සිටීමට කලින් කල වී නිෂ්පාදන පිරිවැය සම්බන්ධව කරුණු සොයා බැලීම, මහවැලිය බඳු කඩිනම් සංවර්ධන යෝජනා ක්‍රම රැසක්ම ක්‍රියාත්මක වන මෙකල විශේෂයෙන්ම වැදගත් වේ. කෙසේ වුවත් ඒ පිළිබඳ තොරතුරුවල හිඟයක් පැවතීම, වී ගොවිතැනට අදල ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනයේ යෙදෙන්නන්ට සෑහෙන කාලයක් තිස්සේ ඔවුන්ගේ කටයුතු වලට බාධකයක්ව පැවතුනි. මේ හේතුව කුඹුරු ගොවිතැනේ නිෂ්පාදන වියදම්, ලාභ මට්ටම හා යෙදවුම් භාවිතය වැනි ලක්ෂණ අවබෝධ කර ගැනිම උදෙසා 1976/77 මහ කන්නයේදී වී ගොවිතැනේ ලාභදායීතාවය හා සම්පත් භාවිතය පිළිබඳව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය අධ්‍යයනයක යෙදීමට තුඩු දුනි. පහත සඳහන් සාකච්ඡාවෙන් උපුටා දක්වෙන්නේ එම අධ්‍යයනයෙන් ලබාගත් වැදගත් කරුණු සමහරකුයි[1]. මෙම අධ්‍යයනය සිදු කල අවස්ථාවේදී වීවල සහතික මිළ බුසලක් රු. 33/- ක්ව පැවති අතර එම මිළ බුසලකට රු. 40/- දක්වා සංශෝධනය කිරීමේදි මෙම වාර්තාවද බෙහෙවින් උපකාරී වූ බව මෙහි ලා සඳහන් කළ යුතුය.

මෙම අධ්‍යයනයට වී ගොවිතැනට අදල ප්‍රධාන කෘෂි පාරිසරික කලාප තුනක් නියෝජනය වන පොළොන්නරුව, හම්බන්-තොට, කොළඹ, කෑගල්ල, - මහනුවර දිස්ත්‍රික්කවල ගොවිකාරක සභා අටකින් කුඹුරු ගොවිතැන් කරන ගොවීන් 333 දෙනෙකුගෙන් යුතු නියැදියකින් තොරතුරු රැස්කර ගන්නා ලදී.

අධ්‍යයනයට යොමු වූ ප්‍රදේශවල කුඹුරු අක්කරයක් වගා කිරීමට දරූ මුදල්මය පිරිවැය, ගොවිපලක සාමාන්‍ය ප්‍රමාණය සහ ලබා ගත් සාමාන්‍ය අස්වැන්න පළවන වගුවෙහි පරිදි වන්නේ යයි අධ්‍යයනයෙන් හෙළි කර ඇත.

මතු දක්වෙන මුදල්මය පිරිවැයට ගොවීන් විසින් වී නිෂ්පාදනයට වැය කළ මුදල් ප්‍රමාණය පමණක් ඇතුළත්ව ඇති නිසා, ඔවුන් සතු මී හරක්, ට්‍රැක්ටර් හා පවුලේ ශ්‍රමය යනාදියේ වටිනාකම් අඩංගු නැත. ඇත්තවශයෙන්ම මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී මෙවැනි මුදල්මය නොවන පිරිවැයන් ඉහතින් දක් වූ මුදල්මය පිරිවැයත් යන දෙකම අඩංගු විය යුතු බව නොකිවමනාය.

මේ අනුව අධ්‍යයනයෙන් පෙන්වා දෙන ලද පරිදි අක්කරයක මුළු නිෂ්පාදනය පිරිවැය පහත සඳහන් අන්දමට තිබෙන බව පෙන්වා දී ඇත.

| | |
|---|---|
| පොළොන්නරුව | රු. 1,849 |
| හම්බන්තොට | රු. 1,293 |
| කෑගල්ල-මහනුවර | රු. 1 219 |
| කොළඹ | රු. 949 |

මේ ප්‍රදේශවල පිළිවෙලින් අක්කරයකට වී බුසල් 76, 56, 48 හා 32 ක්වූ සාමාන්‍ය අස්වැන්නක් ලබාගෙන තිබුනි. ඒ අනුව බුසලක නිෂ්පාදන වියදමේ ප්‍රමාණය හා ලාභ ප්‍රමාණය දෙවන වගුවෙහි සඳහන් ලෙස යැයි දක්වා ඇත.

මෙම අධ්‍යයනයෙහි සළකා බලා ඇති තවත් ප්‍රයෝජනවත් කරුණක් නම් ගොවිපල මට්ටමේදී නිෂ්පාදනය කෙරෙන වීවල පරිහරණ ක්‍රම පිළිබඳවයි. (3 වන වගුව බලන්න.)

මෙම දත්ත වලින් හෙළි වන පරිදි පොළොන්නරුව (බුසල් 191) සහ හම්බන්තොට (බුසල් 108) ගොවීන් සිය නිෂ්පාදන වලින් වැඩි ප්‍රමාණයක් වෙළදම් කරන අතර කෑගල්ල-මහනුවර සහ කොළඹ වැනි තෙත් කලාපීය ප්‍රදේශවල මෙම ප්‍රමාණය ඉතාමත් අල්පය. මේ අනුව සහතික මිළ ක්‍රමයෙන් ගොවීන්ට අත් වන වාසි වලින් වැඩි ප්‍රයෝජනයක් ලබන්නේ වියළි කලාපයේ ගොවීන් බව පෙන්වා දී ඇත.

මෙම අධ්‍යයනයෙන් අවධාරණය කෙරෙන තවත් කරුණක් නම් වගා ණය පිළිබඳ විග්‍රහයයි. වී වගාවට දෙන ණය ලබා දීමට උවමනා ආයතනික විවිවිධාන සළස්වා ඇත්තේ මහජන බැංකුව සහ ලංකා බැංකුව වන අතර මේ ණය ඒ ඒ කාර්යයට අදළ උපරිම සීමාවකට යටත්ය. එම ණය සීමාවන් කුඹුරු ගොවිතැනෙහිදී දැරීමට සිදු වන තත්‍ය නිෂ්පාදන පිරිවැය සමඟ සසඳ බැලීමක් ද මෙහිදී සිදු කර ඇත. මේ අනුව ඉඩම් සැකසීම, පැල සිටුවීම සහ අස්වනු කැපීම යන කාර්යයන්වලද තත්‍ය පිරිවැය ප්‍රමාණ අනුමත ණය සීමාව ඉක්මවා ඇති බවත්, වල් පැලෑටි මර්ධනය' රෝග සහ පලිබෝධ මර්ධන කාර්යයන්ට දෙනු ලබන වගා ණය ප්‍රමාණය තත්‍ය මුදල් පිරිවැයට වැඩි බවත් පෙන්නුම් කරයි. (4 වන වගුව බලන්න.)

මෙම පරීක්‍ෂණ අනුව දැනට කුඹුරු ගොවිතැන උදෙසා පවතින ණය ක්‍රම ව්‍යුහයෙහි උපරිම සීමාවල ඇතැම් ගැලපුම් කිරීම සැළකිල්ලට භාජනය කළයුතුව ඇති බව පෙන්වා දී ඇත.

කෙසේ වුවද නිෂ්පාදන පිරිවැය මට්ටම්වල නිරතුරුව සිදු වන වෙනස්කම් හේතුවෙන් මෙවැනි විස්තරාත්මක හැදෑරීම්වල වැදගත්කම මෙම අධ්‍යයනය අවධාරණය කර ඇත.

### පළමුවන වගුව

| දිස්ත්‍රික්කය | අක්කරයට දැරූ මුදල්මය නිෂ්පාදන පිරිවැය | ගොවියකු සතු කුඹුරු බිම් සාමාන්‍යය | කුඹුරු වගාවට සාමාන්‍ය වියදම |
|---|---|---|---|
| | රු. | අක්කර | රු. |
| පොළොන්නරුව | 1162 | 31/2 | 4172 |
| හම්බන්තොට | 822 | 31/2 | 2702 |
| කෑගල්ල - මහනුවර | 682 | 3/4 | 518 |
| කොළඹ | 485 | 3/4 | 354 |

### දෙවන වගුව

| | පොළොන්නරුව | හම්බන්තොට | කෑගල්ල-මහනුවර | කොළඹ |
|---|---|---|---|---|
| වී බුසලක සාමාන්‍ය නිෂ්පාදන වියදම | 24·39 | 23·00 | 25·44 | 29·75 |
| ලාභ ප්‍රමාණය (බුසලක මිළ රු. 33/- සේ සළකා) | 8·61 | 10·00 | 7·50 | 3·25 |

### තුන්වන වගුව

| | පොළොන්නරුව | | හම්බන්තොට | | කෑගල්ල මහනුවර | | කොළඹ | |
|---|---|---|---|---|---|---|---|---|
| | බුසල් | % | බුසල් | % | බුසල් | % | බුසල් | % |
| මුළු නිමැවුම | 273 | 100 | 197 | 100 | 36 | 100 | 23 | 100 |
| පිට විකිණීම | 191 | 70 | 108 | 55 | 8 | 22 | 3 | 13 |
| ද්‍රව්‍යයෙන් කරන ගෙවීම් | 8 | 3 | 42 | 21 | 5 | 15 | 2 | 9 |
| නිවසේ රඳවා ගැනීම (පරිභෝජනය/බිත්තර වී) | 74 | 27 | 47 | 24 | 23 | 63 | 18 | 78 |

### හතරවන වගුව

| | අක්කරයට අනුමත ඉහළම ණය සීමාව | අක්කරයට දැරූ තත්‍ය නිෂ්පාදන වියදම් | |
|---|---|---|---|
| | | පොළොන්නරුව | හම්බන්තොට |
| | රු. | රු. | රු. |
| බිම් සැකසීම | 150 | 239 | 219 |
| පැල සිටුවීම | 100 | 206 | 117 |
| අස්වනු කැපීම | 75 | 326 | 228 |
| පලිබෝධ හා වල් පැලෑටි මර්ධනය | 200 | 84 | 69 |